දකුණු වලිකාමම් ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 08 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 මාර්තු 30 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරිම් අනුව දකුණු වලිකාමම් ප්‍රදේශිය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2012 දෙසැම්බර් 31 දිනට දකුණු වලිකාමම් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) වත්කම්, වගකීම් සහ ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | වගකීම් | | ආදායම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 2,972 | - | - | - | - |
| වර්ගීකරණ දෝශ | 01 | 3,242,600 | 02 | 31,946,088 | 01 | 2,477,000 |
| අත්හැරීම් | - | - | 01 | 3,943,714 | - | - |

(ආ) ගිණුම්ගත නොකළ වත්කම්

-----------------------------------

(i.) සභාවට අයත් ඉඩම් 08 ක් අගය කර අවසන් ගිණුම් වලට ඇතුලත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ii.) සභාවට ප්‍රදානය කරන ලද මෝටර් වාහන 07 ක් අගය කර අවසන් ගිණුම් වලට ඇතුලත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-------------------------------

පාලන ගිණුම් අනුව ගිණුම් වල ශේෂයන්ගේ එකතුව රු.1,223,629 ක් වූ අතර උපකාරක ලේඛන අනුව මෙම ගිණුම් වල ශේෂයන්ගේ එකතුව රු.1,314,281 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---------------------------------------------

විගණනයට අවශ්‍ය තොරතුරු නොමැතිවීම නිසා එකතුව රු.120,195,116 ක් වූ ගනුදෙනු 05 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

----------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.119,141 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.286,391 ක් විය.

2.2 මූල්‍ය පාලනය

------------------

අයවැය ලේඛණය නිසි ලෙස පිළියෙල කර නොතිබූ අතර එම හේතුවෙන් තථ්‍ය ආදායම් සහ අයවැයගත ආදායම් අතර රු.18,788,460 ක වෙනසක් ද අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු. 9,944,955 ක වෙනසක් ද විගණනයේදි නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

---------------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 1,630 | 1,004 | 5,924 |
| බදුකුලී | 27,062 | 27,650 | 440 |
| බලපත්‍ර ගාස්තු | 1,780 | 1,817 | - |
| වෙනත් ආදායම් | 54,022 | 72,811 | 34,594 |

2.3.2 ආදායම් කළමනාකරණය

----------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ බදු කුලි වෙළඳ බලපත්‍ර ගාස්තු සහ වෙනත් ආදායම් රු.9,012,348 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.3.3 ආදායම් අහිමි විම

-------------------------

1999 වර්ෂයේ සිට විදුලිබලය සැපයිමට අදාල කටයුතු ලංකා විදුලිබල මණ්ඩලය වෙත භාර දී තිබුණු නමුත් සභා බල ප්‍රදේශය තුල වීථි ලාම්පු නඩත්තු කිරිම සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලැබිය යුතු රු.677,827 ක මුදලක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. එබැවින් සභාවට පාඩුවක් සිදු වි තිබුණි.

2.3.4 උසාවි දඩ

---------------

2012 වර්ෂය තුල උසාවි විසින් විවිධ අණපනත් යටතේ පනවන ලද උසාවි දඩ සොයා දැනගෙන ගිණුම් වලට ගෙන නොතිබුණි.

2.3.5 මුද්දර ගාස්තු

------------------

2006, 2007 සහ 2012 කාලපරිච්ඡේද සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු පිළිවෙලින් රු.2,340,163 ක් රු.5,611,669 ක් සහ රු.23,994,242 ක් වු මුද්දර ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

-------------------------------

2.4.1 අයකරගතයුතු කාර්ය මණ්ඩල ණය

------------------------------------------

සභාවේ විශ්‍රමලත් නිලධාරින්ගෙන් අයකර ගතයුතු රු.61,236 ක් විශ්‍රාමිකයන්ගේ පාරිතෝෂික මුදලෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගනු වෙනුවට අඛණ්ඩව ගිණුම්වල දක්වා තිබුණි.

2.4.2 සමීක්ෂණය නොකළ වත්කම්

-------------------------------------

වත්කම් වල වටිනාකම 2012 දෙසැම්බර් 31 දිනට වූ භෞතික සමීක්ෂණයකින් සනාථ කර නොතිබුණු අතර පොත් අගය මත පදනම්ව වටිනාකම රු.125,892,406 ක් ලෙස දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | වටිනාකම |
|---|---|
| | රු. |
| ස්ථාවර වත්කම් | 124,668,777 |
| ගබඩා විෂයයන් | 1,223,629 |
| | ---------------- |
| | 125,892,406 |
| | =========== |

2.5 අනුකූල නොවීම්

-----------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදි නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදායට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ---------------------------------- | | ------------------ |
| (අ) | ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන) රීති - 1989 | | |
| | (i) III පරිච්ඡේදයේ 33 වගන්තිය | - | බදු ගෙවීම් පැහැර හැරි පුද්ගලයින්ගේ ලැයිස්තුවක් එක් එක් කාර්තුව අවසානයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (ii) III පරිච්ඡේදයේ 76 වගන්තිය | - | රු.3,082,264 ක් වූ බදු කුලී අයකිරිමට ප්‍රමාද විම පිළිබඳව ආදායම් ලිපිකරු විසින් ලේකම්වරයාට/සභාපතිවරයාට දන්වා නොතිබුණි. |
| | (iii) V පරිදච්ඡේදයේ 140 වගන්තිය | - | රු.268,567 ක් වූ අත්තිකාරම් නියමිත දිනට පියවා නොතිබුණු අතර සභාවේ ලේකම්වරයා විසින් පැහැර හැරි පුද්ගලයන් හතරදෙනෙකුට එරෙහිව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i.) මු.රෙ. 396 | - | මාස 06 කට අධික කාලයක් උපලබ්ධි නොවි පැවති රු.8,455 ක් චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කර නොතිබුණි. |
| | (ii.) මු.රෙ.571 | - | වර්ෂ 02 කට අධික කාලයක් පැවති රු.570,386 ක් වූ විවධ තැන්පතු ආදායම් ගිණුමට මාරු කිරිමට කටයුතු කර නොතිබුණී. |
| (ඇ) | උතුරු පළාත් සභාවේ මුදල් රීති අංක 101 සහ 102 | - | අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පණත | - | ජාතිය ගොඩනැගීමේ බදු රු.28,115 ක් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදය

--------------------------------------------

(i.) වාර්ෂික සැලැස්ම නිසි පරිදි පිළියෙල කොට සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඉල්ලන්තිකඩෙයි මාර්ගයේ වටිනාකම රු.3,010,000 ක් වූ අළුත්වැඩියා කටයුතු ප්‍රමාද වි තිබුණි. කෙසේ වුවත් ඉදිරියේදි ඉහත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම පිණිස සංවර්ධන සංචිතයක් ඇතිකර තිබුණි.

(ii.) සමාලෝචිත වර්ෂය තුල ඉටු කිරිමට නියමිතව තිබූ ප්‍රාග්ධන වැඩ 10 ක් ප්‍රමාද වි තිබුණු අතර මෙම ප්‍රාග්ධන වැඩ ඉදිරියේදි ක්‍රියාත්මක කිරිම සඳහා විවිධ ණය හිමි ගිණුම යටතේ රු.18,875,651 ක් වූ ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

(iii.) ඉකුත් වර්ෂයන්හිදි රු.2,478,366 ක් වටිනා ව්‍යාපෘති 11 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා තිබුණු අතර මෙම ව්‍යාපෘති මුදල් වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ වෙනුවට අළුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) සම්පූර්ණයෙන් අත්හැර දැමු ව්‍යාපෘති

---------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරිමට නියමිතව තිබූ වටිනාකම රු.720,000 ක් වූ ඉනුවිල් නෙයම්පති මාර්ගය අළුත්වැඩියාව සහ තාර දැමීමේ ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ ගොඩනැගිලි විස්තාරණය, ප්‍රාග්ධන වැඩ සහ වෙනත් වැඩ සඳහා ලද එකතුව රු.1,581,486 ක් වූ පරිත්‍යාග එම වැඩ ක්‍රියාත්මක නොකොට විවිධ තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහත පරිත්‍යාග මගින් සභාවට අයත් ප්‍රදේශයන්හි මහජනයා හට ප්‍රයෝජනයක් සැලසී නොතිබුණි.

(ආ) වැන්දඹු සහ අනත්දරු අරමුදල සඳහා 2006 වර්ෂයේදි සලසන ලද රු.222,400 ක් වූ ප්‍රතිපාදනය මෙම වාර්තාවේ දිනය දක්වාම ගෙවා නොතිබුණි.

(ඇ) ප්‍රාග්ධන වැඩ 11 ක් සඳහා ගෙවිය යුතු රු.2,478,366 ක් සඳහා ප්‍රතිපාදන සලසා තිබුණු අතර මෙම ගෙවීම් වර්ෂයකට අධික කාලයක් තිස්සේ ගෙවා නොතිබුණි.

(ඇ) 2008-2011 කාලපරිච්ඡේදය තුල කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගන්නා ලද රු.147,080 ක් වූ රඳවුම් මුදල් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට කටයුතු නොකොට විවිධ තැන්පතු ගිණුමෙහි තබාගෙන තිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

-----------------------------

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(i.) ආදායම් රැස්කිරීම

(ii.) ස්ථාවර වත්කම්

(iii.) ගිණුම්කරණය

(iv.) මානව සම්පත් කළමනාකරණය

(v.) පරිත්‍යාග

(vi.) විවිධ තැන්පතු